තංගල්ල නගර සභාව
හම්බන්තොට දිස්ත්‍රික්කය
---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය රු.126,841 ක් ප්‍රාග්ධන වැය ලෙස ගිණුම්ගත කර තිබුණි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය නිවැරදිව හඳුනා ගත යුතුවේ. | ඉදිරියේදී වත්කම් වටිනාකම වැඩි නොකරන වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ලද රු. 127,923 ක් වූ උසාවි දඩ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | උසාවි දඩ නිවැරදි කාලපරිච්ඡේදයට ගිණුම්ගත කළ යුතුවේ. | රු. 6,250 ක් ඉකුත් වර්ෂවලට අදාළ අතර ණයගැති වෙනුවට ආදායම් ශීර්ෂයට සටහන් වී ඇති බවත්, රු. 121,673 කට අදාළව කාල සීමාවක් සඳහන් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇති බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු. රෙ. (1) 103 | නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය හා පෙර පාසල සතු එකතු වටිනාකම රු. 803,000 ක් වූ උපකරණ 05 ක පැවති ඌනතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඌනතා ලෙස හඳුනා ගෙන ඇති භාණ්ඩ අයිතම සඳහා අධිකරණය විසින් නියම කරන ආකාරයට ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |
| ii. | මු.රෙ. 134(3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් ඉදිරිපත් කර ඇති බව දන්වමි . |
| iii. | මු. රෙ. 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සහ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ඇති බව දන්වමි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2018 වර්ෂයේදී ධාවනයෙන් ඉවත් කල වටිනාකම රු. 4,000,000 ක් වූ ටිපර් රථය අපහරනය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ටිපර් රථය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්ගේ පීඑෆ්/ආර්ඊඩී/සීඕපීජ්/ 2019/01 ලිපිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට කාර්යසාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකෙ/ 2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | සභාව සතු කඩ කාමර 86 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර යාවත්කාලීන නොකල කාල පරාසය මාස 02 ත් අවුරුදු 37 ත් අතර විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 86 න් 70 ක් සම්බන්ධව තංගල්ල පළාත් බද මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර, තීන්දුව ලැබුණු පසු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බවත්, ඉතිරි කඩ කාමර 16 හි පවතින ගැටළු නිසා ගිවිසුම්ගත නොවූ බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 16,424,786 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,522,614 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,100,000 | 7,124,470 | 6,704,295 | 2,199,238 | 6,200,000 | 6,968,445 | 6,817,032 | 1,355,210 |
| කුලී | 14,063,000 | 17,296,305 | 13,570,165 | 4,047,062 | 11,709,700 | 10,640,705 | 10,503,241 | 82,459 |
| බලපත්‍ර ගාස්තු | 903,000 | 796,529 | 784,528 | 12,000 | 1,153,000 | 891,252 | 891,252 | - |
| වෙනත් ආදායම් | 21,190,600 | 16,357,196 | 8,162,414 | 24,435,939 | 21,799,500 | 15,244,506 | 14,904,465 | 14,875,983 |
| එකතුව | 43,256,600 | 41,574,500 | 29,221,402 | 30,694,239 | 40,862,200 | 33,744,908 | 33,115,990 | 16,313,652 |

**2.2.2 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් හා බදු රු. 2,199,238 ක් අයකර ගැනීමට නගර සභා පනතේ 170 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් හා බදු වලින් 2020 ජුනි මස වන විට රු. 589,087 ක් අයකර ගත් බවත් ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් තක්සේරු ලේඛනයේ ලේඛනගතව තිබුණද භෞතිකව නොමැති දේපල ඒකක 17 කින් ලැබිය යුතු වරිපනම් බදු රු. 22,227 ක් විය. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | භෞතිකව හඳුනාගත නොහැකි දේපල 17 න් ලැබිය යුතු රු. 22,227 ක් පළාත් පාලන සහකාර කොමසාරිස් දැනුවත් කර කපා හරින ලද බව දන්වමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවට අයත් කඩ කාමර 129 කින් ලැබිය යුතු කඩ කුලී රු. 3,603,712 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිඟ හිටි ශේෂය තුල වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර හා වර්ෂ 05 වැඩි ශේෂය පිළිවෙලින් රු. 12,750 ක් හා රු. 14,456 ක් විය. | හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කුලී අය කිරීමට නොහැකි වූයේ නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට එරෙහිව පවතින නඩුවක් නිසා බවත්, නඩුවේ තීන්දුව ලැබුණු පසු අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු එකතුව රු. 443,350 ක් වූ නිවාස කුලී, ඉඩම් බදු කුලී, ගොඩනැඟිලි කුලී හා ධීවර විවේකාගාර කුලී අය කරගැනීමට කටයුතු නොතිබුණි. | හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 178,160 ක් අයකර ගත් බවත්, රු. 239,750 ක් වූ ඉඩම් බදු අය කිරීමට නොහැකි වූයේ මහාධිකරණයේ නඩුවක් පවතින නිසා බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 23,764,487 ක් වූ අතර, ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර හා වර්ෂ 05 ට වැඩි ශේෂය පිළිවෙලින් රු. 16,046,487 ක් හා රු. 218,000 ක් විය. | හිඟ මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 මැයි මස වන විට හිඟයෙන් රු. 3,600,000 ක් අයකර ගත් බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරනා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එක් කාරණාවක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි උප නීති වැලඳ ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභාව අය කළ ආදායම් ප්‍රභවයන් 10 කට අදාළව ගාස්තු පැනවීම සම්බන්ධයෙන් ගැසට් නිවේදන පල කර නොතිබුණි. | ගාස්තු පැනවීමේදී ගැසට් නිවේදන පල කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ආදායම් ප්‍රභවයන් ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය නොලැබීම මත ගැසට් නොකරන ලද බව දන්වමි. |

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු. 10,975,100 ක් වූ සංවර්ධන යෝජනා 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | මෙම සංවර්ධන යෝජනා අරමුදල් නොමැති වීම, පළාත් පාලන දෙපාර්තමේන්තුව අනුමත නොකිරීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටුකර තිබීම හේතු වූ බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | මේ පිළිබඳව නිසි මග පෙන්වීමක් හා පුහුණුවක් නොලැබීම මත ඵලදායිව සකස් කිරීමට නොහැකි වූ බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අසාධු ලේඛන ගත කර තිබූ ටෙන්ඩර්කරුවන් 06 දෙනෙකුට අදාල රු. 130,000 ක් වූ ටෙන්ඩර් ඇප තැන්පත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි. | ටෙන්ඩර් ඇප තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 22 ක් පිරවීමට හා අතිරික්තතා 28 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතිරික්ත නිලධාරීන් 28 දෙනා අතරින් 17 ක් 25/2014 චක්‍රලේඛය මත බඳවා ගත් බවත්, පුරප්පාඩු 22 ක් පැවතියද ඉන් 08 ක් බඳවා ගැනීමේ බලය සභාව සතුව නොපවතින අතර, එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කරගත් බවත්, ඉතිරිය සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ලැබිය යුතු උත්සව හා ආපදා ණය එකතුව රු. 51,135 ක් විය. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම නිලධාරීන් වසර 10 ක් සම්පූර්ණ කර නිලධාරීන් වන අතර, අයකරගත නොහැකි නිසා කපා හැරීමට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යොමුකළ බව දන්වමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත කළ ගොඩනැඟිලි සැලසුම්වල කාලය දීර්ඝ කර නොමැති අවස්ථාවන්වල දේපලහිමියන් දැනුවත් කිරීමට හා ඉදිකිරීම නිම කළ ගොඩනැඟිලි සඳහා අනුකූලතා සහතික ලබා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | අනුකූලතා සහතික ලබා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | වසරක් ඇතුළත වැඩ නිම නොකළ ඉදිකිරීම් සඳහා කාලය දීර්ඝ කර ගන්නා ලෙසත්, නිමකළ ඉදිකිරීම් සඳහා අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස දේපල හිමියන් දැනුවත් කළ බවත්, 2017 සිට 2019 දක්වා අනුමත කළ සැලසුම් සඳහා 2020 වර්ෂයේදී සිහි කැඳවීම්ද කරන ලද බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු එකතු වටිනාකම රු. 1,187,000 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි 07 ක් ඵලදායී කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් 04 ක අයිතිය සභාව සතු නොවන බවත්, ඉඩම් 02 ක් මාර්ග සංවර්ධනයේදී මාර්ගයට යොදාගෙන ඇති බවත්, ඉතිරි ඉඩම වාහන නතර කිරීම සඳහා යොදාගෙන ඇති බව දන්වමි. |